<u>පළමුවන කියැවීම</u> උත්පත්ති 22:1-2,9-13,15-18

උත්පත්ති පොතෙන් ගත් පාඨයකි.

විශ්වාසයේ පියා වූ ආබ්‍රහම් තුමාගේ යාගය.

කලකට පසු දෙවියන් වහන්සේ ආබ්‍රහම් පරීක්ෂා කරමින් 'ආබ්‍රහම්' කියා ඔහුට හඬ ගැසූ සේක. ඔහුද "ස්වාමිනි, මම මෙහි ය" කියා උත්තර දුනි. එවිට උන් වහන්සේ, "නුඹ දැන් නුඹේ පුත්‍රයා - නුඹ ප්‍රේම කරන නුඹේ එක ම පුත්‍රයා වන ඊසාක් ගෙන මොරියා දේශයට යන්න. එහි ගොස් මා නුඹට පෙන්වන කන්ද මත දවන යාග පූජාවක් මෙන් ඔහු මට ඔප්පු කරන්නැ" යි වදාළ සේක. මෙසේ ගමන් කොට දෙවියන් වහන්සේ වදාළ ස්ථානයට ඔවුන් පැමිණි විට, ආබ්‍රහම් එහි පූජාසනයක් ඉදිකර, පිළිවෙලට දර කැලි තබා, තම පුත් ඊසාක් බැඳ, පූජාසනය පිට තැනූ දර සැය මත තැබීය. මෙසේ තබා ඔහු අත දිගු කොට, සිය පුතු මරණු පිණිස පිහිය අතට ගත්තේය. එවිට සමිඳුණන් වහන්සේගේ දූතයා ස්වර්ගයේ සිට, "ආබ්‍රහම්, ආබ්‍රහම්" කියා හඬ ගැසීය, "මම මෙහි සිටිමි" යි ඔහු කීය. එවිට දූතයා, "ළමයාට අත නොගසන්න. ඔහුට කිසි අනතුරක් නොකරන්න. ඔබේ පුත්‍රයා ඔබේ එකම පුත්‍රයා පූජා කිරීමට තරම්, ඔබ දේව ගරු බිය ඇත්තෙකු බව මට දැන් පෙනේ ය" යි පැවසී ය. එවිට ආබ්‍රහම් හිස ඔසවා බැලූ විට ඔහුට පිටු පසින් අංවලින් පඳුරක පැටලී සිටි බැටළුවෙකු දිටී ය. ආබ්‍රහම් ඌ වෙත ගොස් බැටළුවා ගෙන, සිය පුත්‍රයා වෙනුවට දවන යාග පූජාවක් මෙන් ඌ පූජා කළේ ය. සමිඳුණන් වහන්සේගේ දූතයා දෙවන වරටත් ස්වර්ගයේ සිට ආබ්‍රහම්ට කතා කොට, සමිඳුණන් වහන්සේ මෙසේ වදාරන සේකැ" යි මම දිවුරා කියමි. "ඔබේ පුත්‍රයා ඔබේ එකම පුත්‍රයා පවා මට බිලි පූජා කිරීමට කැමති වී මෙලෙස ක්‍රියා කළ බැවින් මම බෙහෝ සෙයින් ඔබට ආශිර්වාද කරමි. ඔබේ දරු පෙළපත අහසේ තාරකා මෙන්ද වෙරළේ වැලි මෙන්ද බහුල වන සේ වර්ධනය කරමි. ඔබේ පෙළපත සතුරන් පරදා රට හිමි කරගන්නෝය. ඔබ මාගේ හඬට කීකරු වූ බැවින් මිහි පිට සියලු ජාතීහු ඔබ මගින් ආසිරි ලබන්නෝ ය." යි කීය. ආබ්‍රහම් පසුව තම සේවකයන් වෙත ආපසු ගිය විට ඔව්හු සියල්ලෝ ම නැගිට ගොස් බෙයර්-ෂෙබාවෙහි පදිංචි වූ හ. දේව වාක්‍යය එසේ ය.

<u>පිළිතුරු ගීය</u> ගීතාවලිය 116:10,15-19

පිළිතුර: මම සමිඳුන් ඉදිරියේ හැසිරෙන්නෙමි.

ගීය: "මම බොහෝ පීඩා විඳිමි" යි කී අතර වුවද මාගේ විශ්වාසය තිර ලෙස රැක ගතිමි. සැදැහැවතුන්ගේ මරණය සමිඳුන් අබියස අගනේය.

සමිඳුනි, මම ඔබේ මෙහෙකරුවෙක් වෙමි. සැබැවින්ම ඔබේ මෙහෙකරුවෙක් වෙමි. ඔබේ දාසිගේ පුත්‍රයා වෙමි. ඔබ මාගේ බැඳුම් මිදූ සේක. මම ඔබට ස්තුති පූජාව පුදන්නෙමි. සමිඳුන්ගේ නාමය අමතා අයදින්නෙමි.

එසේය සමිඳුන්ගේ මුළු සෙනග ඉදිරියේ මාගේ බාර හාර ඉටු කරන්නෙමි. සමිඳුන්ගේ මාළිගාවේ මළුවල දීත්, එම්බා ජෙරුසලම! තී මධ්‍යයේ දීත් එසේ කරන්නෙමි. සමිඳුන්ට ප්‍රශංසා කරන්න.

## දෙවන කියැවීම

රෝම 8: 31- 34

ශුද්ධ වූ පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

උන් වහන්සේ තමන් වහන්සේගේ පුත්‍රයාණන් වුව ද ඉතිරි කර නොගෙන, අප හැම උදෙසා පරිත්‍යාග කළ සේක.

කරුණු මෙසේ නම් කුමක් නිගමනය කරමු ද? දෙවියන් වහන්සේ අපේ පක්ෂයට නම් අපට විපක්ෂ වන්නේ කවරෙක් ද? උන් වහන්සේ තමන්ගෙ ම පුත්‍රයාණන් වුව ද ඉතිරි කර නොගෙන, අප හැම උදෙසා පරිත්‍යාග කළ සේක. එසේ නම් ඒ දීමනාව සමග උන් වහන්සේ අන් හැම දෙයක් ම අපට නොමසුරු ව දෙන සේක් ද? දෙවියන් වහන්සේගේ විසින් තෝරාගනු ලැබූ අය වරදට පත් කරන්නේ කවරෙක් ද? ඔවුන් නිවැරදි බව ප්‍රකාශ කරන්නේ දෙවියන් වහන්සේ ය. එසේ නම් ඔවුන් වැරදිකරුවන් බවට තීන්දු කරන්නේ කවරෙක් ද? අප උදෙසා මැරුණේත්, අප උදෙසා මරණයෙන් උත්ථාන වූයේත් ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ ය. දෙවියන් වහන්සේගේ දකුණු පස වැඩ සිටිමින් අප වෙනුවෙන් මැදහත් වන්නේත් උන් වහන්සේ ය.දේව වාක්‍යය එසේ ය.

සාධුකාරය — දීප්තිමත් වලාකුළකින් පියාණන්ගේ හඬ ශබ්දය නික්මිණි.
"මේ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝ ය. එතුමන්ට සවන් දෙන්නැ"

## ශුද්ධවූ සුවිශේෂය

මාක් 9: 2- 10

සුවිශේෂක මාක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මෙලොව දී පව් කමා කිරීමේ බලය මනුෂ්‍යය පුත්‍රයාණන්ට ඇත.

සදවසකට පසු ජේසුස් වහන්සේ පේදුරු ද ජාකොබ් ද ජුවාම් ද වෙන් කොට ගෙන, ඔවුන් තමන් සමග උස් කන්දකට ගෙන ගිය සේක. උන් වහන්සේ ඔවුන් ඉදිරියේ අන් වෙසක් වූ සේක. මිහි පිට කිසිවෙකුට සෝදා සුදු කළ නොහැකි තරම් දීප්තියකින් උන් වහන්සේගේ වස්ත්‍ර බැබළිණි. එවිට එලියා ද මෝසෙස් ද ඔවුන්ට දර්ශනය වූ හ. ඔව්හු ජේසුස් වහන්සේ සමග කතා කරමින් සිටියහ. එවිට පේදුරු ජේසුස් වහන්සේට කතා කොට, "ගුරු දේවයිනි, අපට මෙහි සිටින්නට ලැබීම මහත් වාසනාවකි. අපි මන්ඩප තුනක්, එකක් ඔබටත්, එකක් මෝසෙස්ටත්, එකක් එලියාටත්, සාදමු" කීය. ඔවුන් මහා භීතියකින් ඇලළී ගියෙන් කුමක් කියන්න දැ යි ඔහු නොදැන සිටියේය. තවද වලාකුළක් නැගී ඔවුන් සිසාරා පැතිරිණි. එවිට "මේ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝ ය. මොහුට සවන් දෙන්නැ" යි වලාකුළෙන් හඬක් නික්මිණි. හදිසියෙන් අවට බැලූ විට, ඔව්හු තමන් සමග ජේසුස් වහන්සේ හැර අන් කිසිවකු නුදුටුවෝය. ඔවුන් කන්දෙන් බසින කල, මනුෂ්‍ය-පුත්‍රයාණන් මළවුන්ගෙන් උත්ථාන වන තුරු තමන් දුටු දේ කිසිවෙකුට නොකියන ලෙස උන් වහන්සේ ඔවුන්ට අණ කළ සේක. එබැවින් ඔවුන් මේ නියමය තදින් සිතට ගත් නමුත්, ඔව්හු මළවුන්ගෙන් උත්ථාන වීම යනු කුමක් දැ යි ඔවුනොවුන් අතර විමසමින් සිටියහ. සුවිශේෂ වාක්‍යය එසේ ය.